# හයවන ඒකකය

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

# Information & Communication Technology

**11 ශ්‍රේණිය** **II කොටස**

1. පහත වගුවෙහි පළමු තීරුවෙහි A සිට D දක්වා විවිධ හානිකර මෘදුකාංග (Malicious software/ malware) පිළිබඳව විස්තර දී ඇත. එහි දෙවන තීරුවෙහි හානිකර මෘදුකාංග ලැයිස්තුවක් අනුපිළිවෙළින් තොරව දී ඇත. (2016)

| විස්තරය | හානිකර මෘදුකාංග |
|---|---|
| A - අව්‍යාජ බවක් පෙන්නුම් කරන අතර පරිශීලක නොදැනුවත්ව පද්ධතියට ඇතුළු වේ. දත්ත සොරකම් කිරීම හෝ මැකීම සිදු කරයි. | ආයාචිත තැපෑල (Spam) |
| B - විද්‍යුත් තැපෑල මගින් බැංකු ගිණුම්වල හෝ ඉලෙක්ට්‍රෝනික ගිණුම්වල තොරතුරු එක්රැස් කර පරිශීලක රවටා මුදල් තැන්පතු සොරකම් කරයි. | ඔත්තුකරුවන් (Spyware) (Trojan horse) |
| C - වෙළෙඳ දැන්වීමකට අදාළ හෝ නොදන්නා අයෙකුගෙන් ලැබෙන හෝ අනවසර (Unauthorized) විද්‍යුත් තැපෑලකි. විද්‍යුත් තැපැල් ලිපින ලබාගෙන නීති විරෝධි කටයුතුවලට උපයෝගී කරගනියි. | පරිගණක වර්ම්ස් (Computer worm) |
| D - විද්‍යුත් තැපැල් අමුණුම්, ව්‍යාජ වෙබ් අඩවි සහ ක්ෂණික පණිවිඩ මගින් තනිවම ක්‍රියාත්මක වීමේ හා පැතිරීමේ හැකියාව ඇත. | ෆිෂින් (Phishing) |

පළමු තීරුවෙහි දී ඇති විස්තරය දෙවන තීරුවෙහි දී ඇති හානිකර මෘදුකාංගයට ගළපන්න. විස්තරයට අදාළ අක්ෂරය සහ නිවැරදි හානිකර මෘදුකාංගය ඔබේ පිළිතුරු පොතෙහි ලියා දක්වන්න.

2. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය (e-waste) ආරක්ෂාකාරී ලෙස බැහැර කිරීමේ ක්‍රම දෙකක් ලියන්න. (2016)

3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළව පරිගණක දෘෂ්ටි සහලක්ෂණය (Computer Vision Syndrome (CVS)), කාපල දෝනි සහලක්ෂණය (Carpel Tunnel Syndrome (CTS)) සහ පුනරාවර්ති ආතති පීඩාව (Repetitive Stress Injury (RSI)) වැනි අහිතකර බලපෑම් අවම කර ගැනීම සඳහා පරිශීලකයෙක් අනුගමනය කළ යුතු නිර්දේශිත නිවැරදි ඉරියව්වලින් ඕනෑම තුනක් ලියා දක්වන්න. (2016)

4. පහත දැක්වෙන සංසිද්ධිය සලකන්න. (2016)
"එක්තරා සමාගමක තොරතුරු තාක්ෂණ කළමණාකරු (IT Manager) අඩු ආදායම් ඇති පවුල්වලට අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම් සඳහා උදව් කරනු ලබන ස්වේච්ඡා සංවිධානයක ක්‍රියාකාරී සමාජිකයකු ද වේ. ඔහු තම සමාගමෙහි ගණුදෙනුකරුවන් වන ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයන්ගේ විද්‍යුත් තැපැල් ලිපින සමාගමේ බලධාරීන්ගේ අනුදැනුමකින් තොරව ස්වේච්ඡා සංවිධානයට අරමුදල් රැස්කිරීමට ආධාර ලබා ගැනීම සඳහා සහය ලබා දෙයි" තොරතුරු තාක්ෂණ කළමණාකරුගේ මෙම ක්‍රියාව සදාචාරාත්මක නොවන්නේ මන්දැ'යි කෙටියෙන් පැහැදිලි කරන්න.

5. එක්තරා කාර්යාලයක පරිගණක දෘඩාංග, ගින්නක් නිසා මුළුමනින්ම විනාශ වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ආචයන උපක්‍රම වල තිබූ ඇතැම් වැදගත් දත්ත සදහටම අහිමි විය. මෙලෙස එම දත්ත අහිමිවීම මගහරවා ගැනීමට ගත හැකිව තිබූ ආරක්ෂාකාරී පියවර කෙටියෙන් පැහැදිලි කරන්න. (2016)

6. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ආරක්ෂාව පිළිබඳ කාරණා ඇතුළත් පහත දී ඇති 1 – 4 වගන්ති සලකා බලන්න. (2017)

1 - අනෙකුත් පරිගණක සඳහා පැතිරවීමට අනිෂ්ට (Malware) මෘදුකාංගයක් එය විසින් ම ප්‍රතිවලිත (Replicates) වීම.

2 - විද්‍යුත් තැපැල් මෘදුකාංගයක ලැබෙන ලිපි රැඳෙන ස්ථානය (Inbox) වෙත, විශේෂ ඉල්ලීමක් නොමැතිව (Unsolicated) විද්‍යුත් තැපැල් ලිපි ලැබීම.

3 - විශ්වාසනීය සන්නිවේදනයක් බව මවාපාමින් යම් අයකුගේ බැංකු ගිණුමක පරිශීලක නාමය (Username) සහ මුරපදය (Password) ලබාගැනීමට තැත් කිරීම.

4 - වෙබ් පිටුවක දී ඇති අනවශ්‍ය ප්‍රවර්ධක අරමුණු ඇති ඉපිලී එන (Pop-ups) නිවේදන විදහා පෙන්වීම.

ඉහත දී ඇති 1 – 4 දක්වා වගන්ති වලට ගැළපෙන පදය පහත ලැයිස්තුවෙන් තෝරාගෙන අදාළ අංකයට ඉදිරියෙන් ලියා දක්වන්න.

> පද ලැයිස්තුව : |අනවශ්‍ය ප්‍රචාරක දැන්වීම් (Adware), ආයාචිත තැපැල් (Spam), තතු බෑම (Phishing), වෙබ් රොබෝවරු (bots), පරිගණක වර්ම් (Computer worm), ගිනිපවුර (Firewall)|

ICT Tutorials HUB

7. රූපයේ දක්වා ඇත්තේ පුද්ගලයෙක් තම පරිගණකය භාවිත කරන අයුරු ය. ඔහුගේ ඉරියව්වට (Posure) අනුව ඔහුට මුහුණ දීමට සිදු විය හැකි සෞඛ්‍ය සම්බන්ධ ගැටලු දෙකක් ලියා දක්වන්න. (2017)



8. 1 – 3 ලේබල්වලින් දක්වා ඇති පහත සදහන් සංසිද්ධි සලකා බලන්න. (2017)

1 - අන්තර්ජාලයෙන් බාගන්නා ලද බලපත්‍ර සහිත මෘදුකාංග යම් පුද්ගලයකු විසින් පිටපත් කර අන් අයට විකිණීම.

2 - සොරකම් කරන ලද පරිශීලක නාමයක් සහ මුරපදයක් භාවිතයෙන් අන්අයකුගේ සමාජ ජාල ගිණුමකට ඇතුළු වීම.

3 - එක් රටක වෙසෙන ගොවි මහතෙකු වෙබ් අඩවි වල ඇති කෘෂිකාර්මික තොරතුරු භාවිත කරන අතර, වෙනත් රටක වෙසෙන ගොවි මහතෙකුට පරිගණක දැනුම හා අන්තර්ජාල ප්‍රවේශය නොමැති වීම නිසා එවැනි තොරතුරු භාවිත කිරීමට නොහැකි වීම.

ඉහත 1 – 3 දක්වා දී ඇති වගන්තිවලට ගැළපෙන පදය පහත ලැයිස්තුවෙන් තෝරාගෙන අදාළ අංකය ඉදිරියේ ලියා දක්වන්න.

| |
|---|
| ලැයිස්තුව : \|චෞරත්වය (Piracy), සයිබර් අපරාධ (Cyber crime), අංකිත බෙදුම (Digital crime), පෞද්ගලිකත්වය (Privacy), විද්‍යුත් ව්‍යාපාර (Electronic business) \| |

9. පහත S1 සිට S4 දක්වා ලේබල මගින් දක්වා ඇත්තේ විවිධ සන්නිවේදන ක්‍රමවේද අවශ්‍ය වන වෙනස් සංසිද්ධි හතරකි.

S1 - බැංකු කළමණාකරුවකු ශ්‍රී ලංකාවේ සිටින අතරතුර ඉන්දියාවේ පිහිටි ඔහුගේ ප්‍රධාන කාර්යාලයේ පැවැත්වෙන රැස්වීමකට එක්වීම.

S2 - ලේකම්වරියක් ඇයගේ කළමණාකරුගේ වාර්තාවක මෘදු පිටපත (Soft copy) වෙනත් නගරයක පිහිටි ශාඛාවක සේවය කරන සියලුම සේවකයන් වෙත යැවීම.

S3 - තාක්ෂණ නිලධාරියකු යන්ත්‍රය අලුත්වැඩියා කර අවසන් බව ඔහුගේ කළමණාකරු වෙත පණිවිඩයකින් දන්වා යැවීම.

S4 - අලෙවි කළමණාකරුවකු, සමාජ සේවා ව්‍යාපෘතියක ඡායාරූප, පාරිභෝගිකයන් සමග බෙදා ගැනීම (Share) සහ ඔවුන්ගේ ප්‍රතිපෝෂණ, විවරණ (Comments) ලෙස තබා ගැනීම.

පහත දී ඇති ලැයිස්තුවෙන් ඉහත දක්වා ඇති එක් එක් සංසිද්ධිය සඳහා වඩාත් ම ගැළපෙන සන්නිවේදන ක්‍රමය හඳුනාගෙන සංසිද්ධි අංකය හා හඳුනාගත් සන්නිවේදන ක්‍රමය ලියා දක්වන්න. (2018)

| |
|---|
| ලැයිස්තුව : {බ්ලොග් (Blog), විද්‍යුත් තැපෑල (Email), ක්ෂණික පණිවුඩ යැවීම (Instant messaging), සමාජ ජාලා (Social network), වීඩියෝ සම්මන්ත්‍රණ (Video conferencing) } |

10. දීර්ඝ කාලයක් පරිගණක හා වැඩ කරන අය ඒ හා බැඳුණු සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් ඇතැම් විට පැමිණිලි කරයි. මේ හා සම්බන්ධ වූ සෞඛ්‍ය ගැටලු (A – C ලේබල), විය හැකි හේතු (G – I ලේබල) හා යෝග්‍ය විසඳුම් (P – W ලේබල) මගින් පහත පෙන්වා ඇත. (2018)

එක් එක් සෞඛ්‍ය ගැටලුව (A – C ලේබල), විය හැකි හේතුවක් (G – I ලේබල) හා යෝග්‍ය විසඳුමක් (P – W ලේබල) සමග ගළපා, එම ගැළපීම ලේබල භාවිත කොට ලියා දක්වන්න.

සටහන : දෙන ලද සෞඛ්‍ය ගැටලුවකට එක් යෝග්‍ය විසඳුමකට වඩා පැවතිය හැකි ය. කෙසේ වෙතත් ඔබ ලිවිය යුත්තේ එක් විසඳුමක් පමණි.

| සෞඛ්‍ය ගැටලුව | විය හැකි හේතුව |
|---|---|
| A - කාපල දෝනා සහලක්ෂණය (Carpel Tunnel Syndrome) | G - නිවැරදි නොවන ඉරියව්ව හෝ නිසි ලෙස සකස් නොවූ අවකාශය (non-ergonic work space) |
| B - පරිගණක දෘෂ්ටි සහලක්ෂණය (Computer Vision Syndrome) | H - ස්නායුවක වේදනා සහගත තෙරපීම අතෙහි මැණික්කටුවෙහි ඉදිරි කොටස හරහා ගමන් කිරීම. |
| C - මාංශපේශි සහ අස්ථි ආශ්‍රිත ගැටලු (Musculoskeletal Disorder) | I - දිගු කාලයක් පරිගණක තිරය දෙස බලා සිටීම. |

යෝග්‍ය විසඳුම් :

P - ඉහළ බැලීමෙන් සහ ඈත පිහිටි වස්තූන් දෙස මොහොතක් එක එල්ලේ බලා සිටීමෙන් ඇසෙහි පේශින්ට විවේකයක් ලබා දීම.

Q - නිරන්තරයෙන් සිට ගැනීම හා අත්, ඇඟිලි හා පිටපැත්ත දිගෑදීම (Stretch)

R - පුනර්වර්ත කාර්යයන්ගෙන් ක්‍රමානුකූලව විවේකය ලබා ගැනීමට සිහිකැඳවීම සඳහා එළාම් ඔරලෝසු භාවිතය

S - මැණික්කටුව නැමීමෙන් වැළකීම හා යතුරුලියනය කරන විට අත්, මැණික්කටුව හා ඇඟිලි කෙලින් තබා ගැනීම.

T - යතුරු පුවරු කෙටිමං (Keyboard shortcut) භාවිතයෙන් යතුරු ලිවීම අඩු කර ගැනීම හා මූසික චලන අඩු කර ගැනීම.

U - යතුරු ලිවීමේදී යතුරු තදින් එබීමෙන් වැළකීම/ ස්පර්ශ යතුරු ලියනය (Touch typing)

V - එළිකණ (Glare) වළක්වා ගැනීමට පරිගණකය නිසි ස්ථානයක පිහිටුවා ගැනීම/ ජනේලවලට තිර රෙදි භාවිතය

W - ඇස් මට්ටමට වඩා 15º - 20º දක්වා ප්‍රමාණයක් පහතින් පරිගණක තිරය තබා ගැනීම.

11. පහත එක් එක් ගැටලුවට (A – D) අදාළ පදය දී ඇති පද ලැයිස්තුවෙන් තෝරා, එම පදය අදාළ ලේබලය ඉදිරියෙන් ලියා දක්වන්න. (2018)

A - පිළිගත් ආයතනයකින් එවා ඇති සේ හැඟී යන පරිදි පුද්ගලයකුට විද්‍යුත් ලිපියක් ලැබීම සහ එමගින් පුද්ගලයාගේ මාර්ගගත බැංකු පහසුකමට අදාළ ණයපත් (Credit card) අංකය, පරිශීලක නාමය සහ මුරපදය වැනි පෞද්ගලික තොරතුරු ඉල්ලා සිටීම.

B - වෙන කෙනකුගේ නිර්මාණයක් තමන්ගේ එකක් ලෙස පළ කිරීම.

C - යම් අයකු විසින් පරිගණක ජාලයකට අනවසරයෙන් ඇතුලු වී නම, ලිපිනය වැනි පාරිභෝගිකයන්ගේ පෞද්ගලික තොරතුරු ලබා ගැනීම.

D - පුද්ගලයකු බලපත්‍ර සහිත මෘදුකාංගයක අනවසර පිටපත් මුල් මුදලින් 5% ක මුදලකට විකිණීම.

| |
|---|
| පද ලැයිස්තුව : {සාධාරණ භාවිතය (Fair use), වංචාව (Forgery), හැක් කිරීම (Hacking), තතු බෑම (Phising), ලිඛිත දෑ සොරකම (Plagiarism), චෞරත්වය (Piracy), ආයාචිත තැපෑල (Spam)} |

12. තොරතුරු තාක්ෂණය හා බැඳුණු අවධානම් කිහිපයක් A සිට D තෙක් ලේබල මගින් පහත දක්වා තිබේ. (2019)

A - දෘඪ තැටිය ක්‍රියා නොකිරීමක් නිසා පරිශීලක ගොනු හා ෆෝල්ඩර නැති වී යාම.

B - සැනෙලි ධාවකයක් (Flash drive) භාවිතයෙන් පසු පරිගණකය අසාමාන්‍ය අයුරින් හැසිරීම.

C - අන්තර්ජාලයට සම්බන්ධ වූ පරිගණකයක ඇති දත්ත වෙත අනවසරයෙන් දුරස්ථව (Remotely) ප්‍රවේශ වීම.

D - පෞද්ගලික පරිගණකයකට නිරන්තරයෙන් සිදු වන බල (Power) සැපයුම් බිඳ වැටීම්

ඉහත අවධානම් අවම කර ගැනීම සඳහා යෝග්‍ය විසඳුම් පහත P සිට U තෙක් ලේබල් කර ඇති ලැයිස්තුවෙන් තෝරාගන්න. අවදානමේ ලේබලය හා ගැළපෙන විසඳුමේ ලේබලය ලියා දක්වන්න.

| |
|---|
| ලැයිස්තුව : {P - නිතර උපස්ථ (Backup) ලබාගැනීම, Q – CCTV ස්ථාපනය, R - ගිනිපවුරු ස්ථාපනය, S - සර්ජන ආරක්ෂක (Surge protectors) භාවිතය , T - අනවරත බල සැපයුමක් (UPS) භාවිතය, U - ප්‍රතිවෛරස් මෘදුකාංග භාවිතය} |

13. අපද්‍රව්‍ය අඩු කිරීම සඳහා 3R | භාවිතය අඩු කිරීම (Reduce), නැවත ප්‍රයෝජනයට ගැනීම (Reuse) හා ප්‍රතිචක්‍රීකරණය (Recycle) | ක්‍රමවේදය පිළිගෙන ඇත. ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය අවම කිරීමට අදාළව, මෙම ක්‍රමවේදය පහදන්න. (2019)

14. වෙබ් අඩවියකින් සන්ධාර කොටසක්, තම රචනයකට, ලිඛිත දෑ සොරකමකින් (Plagiarism) තොරව ශිෂ්‍යයකුට ඇතුළත් කළ හැකි ආකාරය ලියා දක්වන්න. (2019)

15. පහත දක්වා ඇති දුර්භාවිත (A – D තෙක් ලේබල් කර ඇත) සඳහා දී ඇති පද ලැයිස්තුවෙන් අදාළ පදය හඳුනාගෙන, එම එක් එක් පදය, අදාළ වූ දුර්භාවිතාවේ, ලේබලය ඉදිරියෙන් ලේබලය → පදය ආකාරයෙන් ලියා දක්වන්න. (2020)

| ලේබලය | දුර්භාවිතාව |
|---|---|
| A | අයිතිකරුගේ අනුදැනුමකින් තොරව, පරිගණකයක ගබඩා කර ඇති වැදගත් දත්ත හා තොරතුරු සොරකම් කිරීම. |
| B | අන්තර්ජාලයෙන් ඡේදයක් පිටපත් කර (Copy) ඒ බව සඳහන් නොකරමින් ලේඛනයකට ඇලවීම (Paste) |
| C | සේවකයකු විසින් මූල්‍යමය වාසියක් ලබාගැනීම සඳහා වෙනත් අයකුගේ අනන්‍යතාවය භාවිත කිරීම. |
| D | වෙනත් අයකුගේ නවෝත්පාදනයක්, ඔහුගේ/ ඇයගේ අනුදැනුමකින් තොරව වෙනත් සංවර්ධනයක් සඳහා යොදාගැනීම. |

පද ලැයිස්තුව : {අනන්‍යතා සොරකම (Identity theft), බුද්ධිමය දේපළ අයිතීන් උල්ලංඝනය, රචනා සොරකම (Plagiarism), දත්ත සොරකම, චෞරත්වය (Piracy), අයාචිත තැපෑල (Spam)}

16. පහත දැක්වෙන රූපයේ සිටින අයගේ ඉරියව්ව අනුව ඇති විය හැකි සෞඛ්‍යමය ගැටලු හතරක් ලියන්න. (2020)



17. A, B, C, D හා E ලෙස නම් කර ඇති හිස්තැන් සමගින් වූ පහත දී ඇති වගන්ති සලකා බලන්න. එක් එක් වගන්තියේ ඇති හිස්තැන් පිරවීම සඳහා වඩාත්ම යෝග්‍ය වූ පදය පහත දක්වා ඇති පද ලැයිස්තුවෙන් හඳුනාගෙන එම එක් එක් පදය අදාළ එක් එක් ලේබලය ඉදිරියෙන්, ලේබලය → පදය යන ආකාරයෙන් ලියා දක්වන්න. (2020)

a) අනවසර ප්‍රවේශය අවහිර කිරීම මගින්, තනිව පවතින පරිගණකයක ආචයනය කර ඇති දත්ත ආරක්ෂා කිරීමට …………A……….. ක් භාවිත කරනු ලැබේ.

b) පරිගණකයක ක්‍රියාකාරිත්වය ඇනහිටින අවස්ථාවක අත්‍යවශ්‍ය දත්තවල සුරැකිතාව (Safeguard) සඳහා …………B……….. කර තිබීම අත්‍යාවශ්‍ය වේ.

c) විද්‍යුත් බැංකු ගිණුම්වල පරිශීලක නාම සහ මුරපද එකතු කර ගැනීමේ කාර්යය සඳහා පරිශීලකයින්ව මුලා කිරීම (රැවටීම) …………C……….. ලෙස හඳුන්වයි.

d) හානිකර මෘදුකාංගවලින් පරිගණක පද්ධතියක් ආරක්ෂා කර ගැනීමට …………D……….. භාවිත කළ හැකි ය.

e) …………E……….. ක් පරිගණකයක් තුළට ක්‍රියාත්මක කළ හැකි ගොනුවක් සේ ඇතුල් වන අතර එයට ගොනු මකාදැමීම කළ හැකි වේ.

පද ලැයිස්තුව : {උපස්ථ (Backup), වයිරස් ආරක්ෂාව (Virus guard), ගිණිපවුර (Firewall), තතු බෑම (Phishing), මුරපදය (Password), වයිරසය (Virus), අයාචිත තැපැල් යැවීම (Spamming)}

18. පරිගණක දෘෂ්ඨි සහලක්ෂණය (CVS) මගහරවා ගැනීමට එක් නිර්දේශයක් ලියන්න. (2021)

19. විද්‍යුත් අපද්‍රව්‍ය (e-waste) කළමණාකරණය කිරීමේ එක් සුදුසු ක්‍රමයක් ලියන්න. (2021)

20. K – N තෙක් වූ ලේබල මගින් පෙන්වා ඇති විස්තර, පහත පද ලැයිස්තුවෙහි ඇති නිවැරදි පද හා ගළපන්න. එක් එක් ලේබලය ඉදිරියෙන් නිවැරදිව ගළපාගත් පදයේ අංකය,ලේබලය → පදයේ අංකය ආකාරයට ලියා දක්වන්න. (2021)

| ලේබලය | විස්තරය |
|---|---|
| K | තරුණ ගැහැණු ළමුන්ගේ නුසුදුසු ඡායාරූප අන්තර්ජාලයට මුදාහැරීම සහ එවැනි දෑ බය ඉපදවීමට (threatening) හෝ අවමාන තර්ජනය (blackmailing) සඳහා භාවිත කිරීම |
| L | අන් අයකුගේ නිර්මාණයක් (create work) තමුන්ගේ ලෙස ඉදිරිපත් කිරීම |
| M | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට (ICT) ප්‍රවේශවීමේ හැකියාව ඇති අය සහ එසේ නොමැති අය අතර පවතින පරතරය |
| N | ණයපත් (credit card) තොරතුරු ලබාගැනීම සඳහා භාවිතකරුවන් විද්‍යුත් තැපෑල හරහා රැවටීම |

පද ලැයිස්තුව : {1 - සමාජ ජාල අනිසි භාවිතය, 2 - තතුබෑම (phishing), 3 - ලිඛිත දෑ සොරකම (plagiarism), 4 - සයිබර් අපරාධ, 5 - හසුරු කුසලතා අහෝසි වීම, 6 - අංකිත බෙදුම}

21. මුලදී අධි වේගයෙන් ක්‍රියාත්මක වූ සුනිල්ගේ පරිගණකය දැන් ඉතා සෙමෙන් ක්‍රියාත්මක වේ. එය ඉවතලා නව පරිගණකයක් මිලදී ගැනීමට සුනිල්ගේ මිතුරෙකු ඔහුට යෝජනා කරයි. (2022)
ඔබ සුනිල්ගේ මිතුරා සමග එකඟ ද? පැහැදිලි කරන්න.

22. අන්තර්ජාලයෙන් ලබාගත් තොරතුරු නැවත ඉදිරිපත් කරන විට, නිර්මාණ සොරකමෙන් (plagiarism) ගැලවිය හැකි එක් ක්‍රමයක් ලියා දක්වන්න. (2022)

23. "තාක්ෂණය කෙනෙකුගේ සේවකයා මිස ස්වාමියා නොවිය යුතු ය." මෙම වගන්තියේ 'ස්වාමියා වීම' සහ 'සේවකයා වීම' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (2022)

ICT Tutorials HUB